# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර
# Bhiksu University of Sri Lanka - Anuradhapura

2017/2018 අධ්‍යයන වර්ෂය - සමාසික II පරීක්ෂණය
දෙවන වසර
**2017/2018 Academic Year - Semester II Examination**
**Second Year**

## අධ්‍යාපනයේ දාර්ශනික පදනම - EDSG 22033

**උපදෙස්**
ප්‍රශ්න **තුනකට (03)** පමණක් පිළිතුරු සපයන්න.
එක් පිළිතුරකට ලකුණු **විස්සක් 20** ක් පමණි. කාලය පැය 02 යි.

---

1.

I. ප්ලේටෝගේ දාර්ශනික අදහස් අනුව ඔහුගේ දර්ශනයේ පරිණාමයේ කොටස් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

II. ප්ලේටෝ ඉදිරිපත් කළ අධ්‍යාපන සැලැස්ම පැහැදිලි කරන්න. (ලකුණු 07)

III. ප්ලේටෝගේ අධ්‍යාපන චින්තනය ඇසුරින් රටක අධ්‍යාපනය සකස්විය යුතු අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 10)

2.

I. ජීන්ජැක් රූසෝ විසින් රචනාකරන ලද ප්‍රංශ විප්ලවයට හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ විප්ලවයකට හේතුවූ ග්‍රන්ථ **දෙක** නම් කරන්න. (ලකුණු 03)

II. ජීන්ජැක් රූසෝ විසින් ඉදිරිපත්කරන ලද අධ්‍යාපන සැලැස්ම පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 07)

III. ජීන්ජැක් රූසෝගේ අධ්‍යාපන සංකල්ප හා එහි භාවිතාව පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 10)

3.

I. මොන්ටිසෝරි දර්ශනය පෝෂණය කළ දාර්ශනිකයන් තුන් දෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

II. මාරියා මොන්ටිසෝරි දර්ශනයෙන් හඳුනාගතහැකි ලක්ෂණ **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 07)

III. ගුරුවරයා හා ඉගැන්වීම පිළිබඳ මොන්ටිසෝරි දැරූ අදහස් පිළිබඳ විවේචනාත්මකව කරුණු දක්වන්න. (ලකුණු 10)

4.

I. ජුලියස් නියරේගේ අධ්‍යාපන සංකල්ප හා සමාන අදහස් ඉදිරිපත් කළ දාර්ශනිකයෙක් පෙරදිග විය.

a. ඔහුගේ රට කුමක් ද?

b. ඔහුගේ නම කුමක් ද?

c. ඔහුගේ දර්ශනය කුමක් ද? (ලකුණු 03)

II. ටැන්සානියාවේ පැවති යටත් විජිත අධ්‍යාපන ක්‍රමයේ අඩුපාඩු පැහැදිලි කරන්න. (ලකුණු 07)

III. ජුලියස් නියරේගේ අධ්‍යාපන දර්ශනය නයිජීරියාවේ අධ්‍යාපන පද්ධතිය කෙරෙහි අදාළ වන ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 10)

5.

I. බෞද්ධ අධ්‍යාපන දර්ශනයේ පරමාර්ථය පැහැදිලි කරන්න. (ලකුණු 03)

II. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී ගුරුවරයාට සිය පාඩම ඉගැන්වීම, සංවර්ධනය කර ගැනීම උදෙසා බෞද්ධ අධ්‍යාපන දර්ශනයෙන් ලබාගත හැකි උපදේශ පැහැදිලි කරන්න. (ලකුණු 07)

III. බෞද්ධ අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණු **<u>හතරක්</u>** පැහැදිලි කරන්න. (ලකුණු 10)

6. පහත සඳහන් මාතෘකා අතරින් **<u>දෙකක්</u>** විස්තර කරන්න.

I. මහත්මා ගාන්ධිතුමාගේ අධ්‍යාපන සංකල්ප

II. 21 වන සියවසේ අධ්‍යාපනයේ නව ප්‍රවණතා

III. ස්වාභාව වාදය හා අධ්‍යාපනය

IV. උපයෝගිතා වාදය හා අධ්‍යාපනය (ලකුණු 10x02 = 20)